සමුපකාර අතිරික්ත අරමුදල - 2014
----------------------------------------------

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර අතිරික්ත අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම
-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට සමූපකාර අතිරික්ත අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

---------------------------------------

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

----------------------------------------------

(i) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගනු ලැබූ වටිනාකම රු.1,005,124 ක් වූ ස්ථාවර වත්කම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද එය මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ii) මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු රු.298,171,210 ක් වූ ස්ථාවර තැන්පතු ඇප ණය නිරවුල් කිරීම, මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු ආයෝජනය රු.200,000,000 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.151,627,662 ක මුදල් ගලා යාමක් ලෙස දක්වා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර බිල්පත් මිලදී ගෙන නොතිබුණද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු.6,861,658 ක භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමක් මුදල් ගලා යාමක් දක්වා තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

ශේෂ පත්‍රයේ අස්පෘශ්‍ය වත්කම් යටතේ දක්වා තිබුණු පිරිවැය රු.189,001 ක්වූ පරිගණක මෘදුකාංගවල ප්‍රයෝජනවත් ආයු කාලය පුරෝකථනය කර වාර්ෂිකව ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

---------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ගිණුම් විෂයයන් 3කට අදාල ශේෂයන්ගේ එකතුව රු.564,202,779 ක් වුවද උපලේඛනය අනුව එම එකතුව රු.655,433,222 ක් වූයෙන් රු.91,230,443 ක වෙනසක් පැවතුණි.

2.2.4 අවිනිශ්චිත ගිණුම්

------------------

ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණු රු.9,475,735 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම
--------------------------------

එකතුව රු.542,377,482 ක් වූ සමුපකාර සමිති ණය හා ව්‍යාපෘති ණය ශේෂයන් සම්බන්ධයෙන් ශේෂ තහවුරු කිරීමේ ලිපි හා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1999 වර්ෂයේ සිට ඉදිරියට ගෙන යමින් පවතින රු.1,716,566 ක් වූ අගරු චෙක්පත් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) බැරකම් ගිණුම් 05 ක එකතුව රු.1,020,235 ක් වූ ශේෂයක් ඉකුත් වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවතුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ශේෂ නිරවුල් කර නොතිබුණි.

2.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම
------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 188 (2) | මාස 09 කට වැඩි එකතුව රු.73,804 ක්වූ උපලබ්ධි නොවූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ කාර්යසාධන වාර්තාව සමඟ සමුච්චිත අරමුදලේ වෙනස්කම් දැක්වෙන ප්‍රකාශයක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපතක් සහිතව විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
---------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.40,735,573 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.27,722,806 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,012,767 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු.60,910,456 කින් අඩුවී තිබුණද, වෙනත් වියදම් රු.74,001,020 කින් අඩුවී තිබීම හේතුවෙන් මෙම අතිරික්තය ඇතිවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මුල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 මුල්‍ය අතිරික්තය රු.67,946,692 ක් වී තිබුණ අතර එය 2013 වර්ෂය දක්වා අඛන්ඩව පිරිහී තිබුණි. 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදී එය රු. 13,012,767 කින් වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී ආයතනයේ දායකත්වය රු.407,830 ක් වී තිබුණු අතර එය අඛණ්ඩව වර්ධනය වී 2014 වර්ෂයේදී රු.996,036 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
------------------------

4.1 කාර්යසාධනය
---------------

1974 ජනවාරි 10 දිනැති අංක 93/5 දරන ගැසට් නිවේදනය මඟින් පළ කරන ලද සමූපකාර රීතීන්හි 44 (iii) වගන්තිය ප්‍රකාර සමූපකාර අතිරික්ත අරමුදලෙහි මුදල් යෙදවිය හැකි ආකාර පහත පරිදි වේ.

(අ) ප්‍රාථමික සමිතියක කොටස් මිලට ගැනීම,රෙජිස්ට්‍රාර්තුමා නියම කරන වෙනත් ආකාරයකට හෝ එවැනි සමිතියකට ආධාර කිරීම.

(ආ) ලියාපදිංචි සමිතියකට ස්ථාවර වත්කම් මිලට ගැනීමට ආධාර කිරීම.

(ඇ) ඇවරකරුවෙකුට විරුද්ධව ඇති සිවිල් නඩුවකදී ඔහුගේ නිදහසට ක්‍රියා කිරීමට ඔහුට ආධාර කිරීම.

(ඈ) ලියාපදිංචි සමිතිවලට ආධාර කිරීමේ කටයුතු සඳහා පිහිටුවා ඇති වෙනත් ආයතනයකට ආධාර කිරීම

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට සමූපකාර සමිති 35 කින් අයවීමට තිබුණු රු.551,430,773 ක් වූ සක්‍රීය ණය ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේදී අයකර ගෙන තිබුණේ සමූපකාර සමිති 10 කින් රු.110,510,946 ක් පමණි. එය මුළු සක්‍රීය ණය ශේෂයෙන් සියයට 20 ක් විය.

(ආ) අක්‍රිය ණය උපලේඛනය අනුව සමූපකාර සමිති 72 කින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට රු.95,426,361 ක් අයවීමට තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී අයකර තිබුණු ණය වටිනාකම රු.306,503 ක් පමණි. මෙම අක්‍රිය ණය ශේෂ 1989 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා කාලය තුළ සමූපකාර සමිති වෙත ප්‍රදානය කළ ණය මුදල් බව නිරීක්ෂණය විය.

(ඇ) සමූපකාර සංගමයක් විසින් 2008 වර්ෂයේදී රාජ්‍ය බැංකුවකින් රු.40,000,000 ක ණය වර ලිපියක් ලබා ගැනීම වෙනුවෙන් අතිරික්ත අරමුදලේ එකතුව රු.50,000,000 ක් වූ ස්ථාවර තැන්පතු දෙකක් ඇප සුරැකුම් ලෙස ලබා දී තිබුණි. එම සංගමය එකී ණය මුදල ගෙවීම පැහැර හැරීම නිසා බැංකුව විසින් එම තැන්පතු දෙකෙන් හිඟ ණය මුදල හා පොළිය වෙනුවෙන් රු.51,302,293 ක මුදලක් 2014 වර්ෂයේදී හිලව් කර ගෙන තිබුණි.

(ඈ) 2008 වර්ෂයේ අතිරික්ත අරමුදලින් ව්‍යාපෘති ණය ලෙස සමූපකාර සමිතියකට ලබාදුන් රු.5,000,000 ක් වූ මුදල 2016 අගෝස්තු 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) නිකවැරටිය සංවර්ධන සමූපකාර සමිතියට ලබා දුන් ණය

---------------------------------------------------------------

(i) නිකවැරටිය සංවර්ධන සමූපකාර සමිතිය විසින් ලබා ගෙන තිබුණු කොන්ත්‍රාත්තුවකට අවශ්‍ය අරමුදල් සැපයීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අතිරික්ත අරමුදලින් රු.4,000,000 ක ණය මුදලක් ලබා දී තිබුණද ණය ගිවිසුමේ ණය සඳහා අයකරනු ලබන පොලිය, ණය නිරවුල් කල යුතු කාලය හා තැබිය යුතු ඇප සම්බන්ධව විස්තර ඇතුළත් කර නොතිබුණි.

(ii) සමිතිය විසින් කොන්ත්‍රාත්තුව අවසන් කළ පසු ලැබෙන ආදායමින් හෝ සමිතියේ අරමුදලට මුදල් ඒකරාශීවීම යන කාරණා දෙකෙන් පළමුව ලැබෙන මුදලින් එකවර ගෙවා, ණය නිදහස් කර ගන්නා ලෙසට එකඟ වී තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.2,300,000 ක් තව දුරටත් අයවීමට තිබුණි.

(ඊ) ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ ශ්‍රවණාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම හා නවීකරණය කිරීම සඳහා ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.20,000,000 ක හා රු.25,000,000 ක ණය මුදලක් අරමුදලින් ලබා දී තිබුණු අතර ඉන් සමාලෝචිත වර්ෂයේදී ලබා දුන් ණය සඳහා විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. කෙසේ වෙතත් 2016 අගෝස්තු 31 දින වන විටත් සමූපකාර සංවර්ධන ආයතනයෙන් තවදුරටත් රු.25,000,000 ක් අයවීමට තිබුණි.

4.3 අරමුදල් ඌණ උපයෝජනය

-----------------------------------

අරමුදලේ බැංකු ජංගම ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂයේ සෑම මාසයකම රු.21,000,000 කට වඩා වැඩියෙන් පවත්වා ගෙන තිබුණු අතර එය අරමුදලේ අරමුණු ඉටු කර ගැනීමට යොදා නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2016 මාර්තු 09 වන දින දීය.

6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| | ------------------------- | ------------ |
| (අ) | ගිණුම්කරණය | ජ'නල් සටහන් පිළියෙල කිරීම හා අනුමත කිරීම නිසි පරිදි සිදු කර නොතිබුණි. |
| (ආ) | මෙහෙයුම් පාලනය | (i) අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම කෙරෙහි සැලකිලිමත් නොවීම. |
| | | (ii) ණය ලබා දීමේදි ගිවිසුම්වලට එළඹ නොතිබීම හා ණය අයකර ගැනීමේ දුර්වලතා සහ ලබාදුන් ණය පිළිබඳ පසු විපරම් කටයුතු සිදු නොකිරීම. |
| (ඇ) | වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම. |